ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date. 2024.11.27

පැමිණිලිකාර පාර්ශවය : එම්.ජී.ටී.ඩී. මැදවත්ත මහතා,
අංක 14/26, බංගලා වත්ත,
මස්සල, බේරුවල.

වගඋත්තරකාර පාර්ශවය : පො.ප. ආලෝක මහතා,
ස්ථානාධිපති,
විවිධ පැමිණිලි අංශය,
පොලිස් ස්ථානය, අලුත්ගම.

**පැමිණිලි අංකය : HRC/HO/3480/22**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකරු තම පැමිණිල්ලෙන් සඳහන් කර ඇත්තේ, තමා කොළඹ උසස් අධ්‍යාපන තාක්ෂණික විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ අවසන් වසරේ සිසුවෙකු බව යි. බේරුවල, කාලවිල, හාතතුඩුව, අංක 72 දරණ ලිපිනයේ පදිංචි වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි නැමති අය තමාගේ හිතවතියක වූ බැවින් තමා ඇයගේ නිවසට නිතර ආ ගිය බවත්, ඉහත කී වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි නැමති අයට අයත් හර කාඩ්පතක් (Debit Card) භාවිතා කරමින් තමා විසින් රු.106,520/-ක මුදලක් ලබාගෙන ඇති බවට 2022.09.09 දින ඇය විසින් අලුත්ගම පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර තිබූ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එකී පැමිණිල්ල සම්බන්ධයෙන් තමාගෙන් කට උත්තර ලබාගැනීමට 2022.09.11 වන දින තමා හට පොලිසියට පැමිණෙන ලෙසට අලුත්ගම පොලිස් ස්ථානයෙන් දැනුම්දුන් බවත්, ඒ අනුව තමා එදින පෙරවරු 11.00 ට පමණ අලුත්ගම පොලිස් ස්ථානයට ගිය බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත. එම අවස්ථාවේදී මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු විභාගයක් නොකොට සුළු පැමිණිලි අංශය භාර ස්ථානාධිපතිවරයා වන පො.ප. අලෝක නමැති පොලිස් නිලධාරියා තමාව වරදකරුවෙකු ලෙස හඳුන්වා අත්අඩංගුවට ගත් බවත්, ඒ බව තමා, තමාගේ පියාට දැනුම්දීමෙන් පසුව ඔහු පොලිස් ස්ථානයට පැමිණි බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පසුව එම පොලිස් නිලධාරින් විසින් තමාට තර්ජනය කොට එම දිනවල සමාජ මාධ්‍ය ජාලය හරහා සංසරණය වන මුදල් යන්ත්‍ර මඟින් මුදල් සොරා ගන්නා ලද පුද්ගලයෙකුගේ වීඩියෝවක් පෙන්වා එහි සිටින්නේ තමා බවට තර්ජනය කළ බවත්, තමා එය ප්‍රතික්ෂේප කළ බැවින් තමාව බන්ධනාගාර ගත කරන බවට තර්ජනය කළ බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එසේම, අත්අඩංගුවට ගැනීම සිදු වූ දිනට පසුදින තමාට විශ්ව විද්‍යාලයේ අවසන් වසරේ අවසන් පරික්ෂණය පැවැත්වීමට නියමිතව තිබූ බැවින් වගඋත්තරකරුවන් විසින් සිදු කරන ලද බලපෑම් සහ තර්ජන හේතුවෙන් තමා බන්ධනාගාර ගත වුවහොත් එම අවසන් පරික්ෂණයට පෙනීසිටීමට නොහැකි වන නිසා හර කාඩ්පතක් (Debit Card) භාවිතා කරමින් තමා විසින් ලබාගෙන ඇති බවට චෝදනා කරනු ලබන මුදල ගෙවීමට එකඟ වූ බව පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ලේ සඳහන් කර ඇත.

තවදුරටත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ තමාට විරුද්ධව පොලිස් ස්ථානයේ ගොනු කර තිබූ පැමිණිල්ලේ සඳහන් කර ඇති ආකාරයට අවසන් වරට අදාළ කාඩ්පතෙන් මුදල් ලබාගෙන ඇත්තේ 2022.08.27 දින බවයි. එහෙත් එදින තමා, තමාගේ පියාගේ උපන් ගම වන කොත්මලේ සිටි බව පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව පැමිණිලිකරු විසින් දක්වා සිටින්නේ කිසිදු විමර්ශනයකින් තොරව තමාව අත්අඩංගුවට ගැනීම තුළින් තමාගේ මූලික අයිතිවාසිකම් කඩ වූ බවයි.

පැමිණිලිකරු මේ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ද පැමිණිලි කර තිබූ බවත්, ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මෙම මුදල් නැතිවීම සම්බන්ධයෙන් කළුතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මඟින් කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකයට විමර්ශනයක් සිදුකරන ලෙසට උපදෙස් දුන් බවත්, එම විමර්ශනය අනුව මෙම සිදුවීමට තමා සම්බන්ධ නැති බව අනාවරණය කරගෙන ඇති බවත්, එම සිදුවීමට සම්බන්ධ නිලධාරින්ට විරුද්ධව විනය පියවර ගැනීමට පොලිස් අධිකාරිවරයාට දන්වා ඇති බවත් පැමිණිලිකරු විසින් තවදුරටත් දන්වා ඇත.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

මේ සම්බන්ධයෙන් අලුත්ගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පී.එන්.බී. මාගෙදරගම මහතා විසින් 2022.11.20 දිනැතිව වාර්තාවක් ලබාදී ඇති අතර එම වාර්තාවේ සඳහන් වන්නේ 2022.09.09 දින අංක 72, හාතතුඩුව, කාලවිල, බේරුවල ලිපිනයේ පදිංචි HND උසස් අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනය හදාරන වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි යන අය පැමිණිල්ලක් කරමින් තම නිවසේ පොත් මේසයේ පොත් අතර තිබූ සම්පත් බැංකුවේ ATM කාඩ්පත කිසිදු අයෙකු විසින් රැගෙන ගොස් මුදල් ලබාගෙන නැවත එම ස්ථානයට ගෙනැවිත් දමා ඇති බවට පවසමින් CIB I 260/163 යටතේ පැමිණිල්ලක් කර ඇති බවයි. එම පැමිණිල්ලේ තවදුරටත් දක්වා ඇත්තේ වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි යන අය සිය පියා සහ සහෝදරියන් දෙදෙනා සමඟ ජීවත් වන බවත්, තම නංගි වන හංසනී චතුරිකා යන අය එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන්

සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය සමඟ ප්‍රේම සම්බන්ධයක් පැවැත්වූ බවත්, ඔහු නිතර නිතර නිවසට පැමිණි බවත්, නිවසේ රැඳී සිටි බවත්, එම සම්බන්ධයට එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අයගේ පවුලේ අය අකමැති වූ බැවින්, එම සම්බන්ධය නතර කළ නමුත්, ඔහු නිතර නිතර නිවසට ආගිය බවත්, ඔහු පවුලේ සමීපතමයෙකු ලෙස සිටි බවත් ය.

එසේම, වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි යන අය විසින් සිය ATM කාඩ්පතෙන් එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය සමඟ ගොස් අවස්ථා කිහිපයකදීම මුදල් ලබා ගන්නා ලද බවත්, පසුව 2022.09.04 වන දින වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි යන අය සම්පත් බැංකුවේ පානදුර ශාඛාවට ගොස් එම කාඩ් පතෙන් මුදල් ලබා ගැනීමට යාමේදී මුදල් නොමැති බව දැනගත් බැවින් 2022.09.06 දින බැංකුව වෙත ගොස් බැංකු පොත යාවත්කාලීන කර බැංකු පොතෙන් කිසිවෙකු මුදල් ලබාගෙන ඇති බව තහවුරු කරගන්නා ලද බවත්, වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි යන අය විසින් පොලිස් ස්ථානය වෙත සිදු කරන ලද පැමිණිල්ලේ සඳහන් කර ඇති බව අලුත්ගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පී.එන්.බී. මාගෙදරගම මහතා විසින් සිය වාර්තාව තුළ දක්වා ඇත.

එමෙන්ම, ඔහු විසින් සිය වාර්තාව තුළින් වැඩිදුරටත් දක්වා ඇත්තේ වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි යන අය සිය පැමිණිල්ල තුළ ඇයගේ ගිණුමේ මුදල් නොමැති වීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී 2022.08.31 දින රාත්‍රී 7.00 – 9.00 ත් අතර එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය නිවසට පැමිණි බවත්, එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය ඒ අවස්ථාවේදී අත මිට කර මෙතෙන කාඩ් එකක් තිබෙනවා යැයි පවසමින් කාඩ්පත පෙන්වූ බවත්, එසේ පැවසීමට පෙර ද ඔහුගේ අතේ එම කාඩ්පත තිබූ බව තම සහෝදරිය වන හංසනී යන අය පැවසූ බැවින් කාඩ්පතෙන් මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය සැකකරන බවත්, ඔහු 2022.06.07 දින සිට 2022.08.27 දින දක්වා කාලය තුළ වරින් වර තම ගිණුමෙන් රු.106,520/- ක මුදලක් ලබාගෙන ඇති බවත් සඳහන් කර ඇති බවයි.

තවද, ඔහු විසින් සිය වාර්තාව තුළින් වැඩිදුරටත් දක්වා ඇත්තේ ඉහත කී වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි යන අයගේ පැමිණිල්ල විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති අලෝක නැමති නිලධාරියා විසින් විමර්ශනය කළ බවයි. ඒ අනුව එම පැමිණිලි අංශයේ පො.කො. 95111 සිසිර නැමති නිලධාරියා අලුත්ගම ලංකා බැංකුව වෙත ගොස් 2022.08.21 දින සිට 2022.08.27 වන දින පැය 11.00 දක්වා සීසී

ටීවී කැමරා දර්ශන පරික්ෂා කර ඇති අතර, එම නිලධාරියා එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අයගේ ජායාරූපයක් සමඟ සැසඳීමේදී 2022.08.27 වන දින රතු පැහැති ටී ෂර්ට් එකක් සහ කහ පැහැති කොට කලිසමක් සහ මුහුණ ආවරණයක් පැළඳ කොණ්ඩය උඩට පීරා රැවුල වවා ඇති අයෙකු මුදල් ලබාගෙන තිබූ බවත්, පැමිණිලිකරිය විසින් එම තැනැත්තා එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය බවට පො.කො. 95111 සිසිර නැමති නිලධාරියාට පෙන්වා ඇති බවත්, ඒ අනුව එම මුදල් ලබාගන්නා ලද්දේ එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය බවට තහවුරු වූ බවත්, ඒ සම්බන්ධයෙන් සටහන් යොදා ඇති බවත් ප්‍රකාශ කරයි. ඊට සාක්ෂි වශයෙන් පොලිස් පැමිණිල්ල සිදු කළ පැමිණිලිකාරියගේ පියා වන වික්‍රමාරච්චිගේ කරුණාසේන යන අයගෙන් ද ප්‍රකාශයක් සටහන් කර ගත් බවත් ප්‍රකාශ කරයි.

ඉහත කී පොලිස් පැමිණිල්ල සිදු කළ පැමිණිලිකාරියගේ පියා වන වික්‍රමාරච්චිගේ කරුණාසේන යන අයගේ ප්‍රකාශයේ එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය නිතරම තම නිවසට පැමිණි අයෙකු බවත්, 2022.08.31 දින රාත්‍රී 7.00 ට පමණ එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය නිවසට පැමිණි බවත්, එම අවස්ථාවේදී යම් දෙයක් අත මිටි කර තබාගෙන සිටි බවත්, ඒ සමගම ඔහුගේ දුවගේ බැංකු කාඩ් පත පෙන්වා මෙතන කාඩ් එකක් තියෙනවා මේවා එහේ මෙහෙ දාන්න එපා පරිස්සම් කර තබන ලෙසට පවසා එය ලොකු දුවට දුන් බවත් සඳහන් කර ඇත.

තවද, පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවයේ කරුණු අපක්ෂපාතිව විමසා බැලීමෙන් පසුව විමර්ශනයේ තොරතුරු හා සාක්ෂි මත බැංකු කාඩ්පතක් සාවද්‍ය පරිහරණය සහ සාපරාධී විශ්වාසය කඩ කිරිම සිදුකර වරින්වර රු.106,520/- ක් වංචා කිරීමේ චෝදනාව කියාදී පො.ප අලෝක නිලධාරියා විසින් පොලිස් ස්ථානයේදී 2022.09.11 දින පැය 12.00ට අත්අඩංගුවට ගෙන ස්ථානාධිපතිගේ නියෝග ලැබෙන තෙක් සිර මැදිරියේ රඳවා තැබූ බව සඳහන් කරයි. ඉහත සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට හා අධිකරණ නියෝගයක් ලබාගැනීමට කටයුතු කරමින් සිටියදී සැකකරුගේ පියා වන පයාගල පොලිස් ස්ථානයේ පො. ප. ජයරත්න යන අය පොලිස් ස්ථානයට පැමිණ පො.ප. අලෝක නිලධාරියා වෙත ප්‍රකාශ කර ඇත්තේ, තම පුතාගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් අධිකරණය වෙත ඉදිරිපත් නොකරන ලෙසයි. එම අවස්ථාවේදී කළුතර පොලිස් ස්ථානය භාර සහකාර පොලිස් අධිකාරි කළුතර දිස්ත්‍රික් II දුමින්ද රාජපක්ෂ මහතා පැමිණ සිටි අතර, ඔහු වෙත මෙම පැමිණිලිකරුගේ පියා වන ජයරත්න යන අය ප්‍රකාශ කර ඇතතේ පුතාගේ අනාගත අභිවෘද්ධිය මත අධිකරණය වෙත ඉදිරිපත් නොකරන ලෙසයි.

එසේම, අදාළ මුදල නැවත ලබාදිය හැකි බවත්, එම නිසා එසේ විසදා දෙන ලෙසට සැකකරුගේ පියා විසින් ඉල්ලා සිටි බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත. ඉන් අනතුරුව පොලිස් ස්ථානයේදී දෙපාර්ශවය සාකච්ඡා කර ප්‍රශ්නය විසදා ගන්නා ලදි. එහිදී අදාළ මුදල පොලිස් පැමිණිල්ල සිදු කළ පැමිණිලිකාරිය වන වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි වෙත ලබාදීමෙන් අනතුරුව පැමිණිල්ල ඉල්ලා අස් කර ගත් බවට දැනුම්දීමෙන් පසුව එම්.ජී.ටී.ඩී. මැදවත්ත(ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය සිය අත් අකුරින්ම තමාට අධිකරණ කටයුතු අවශ්‍ය නොවන බවත්, අදාළ මුදල කැමැත්තෙන්ම ලබාදෙන බවත් සටහන් කොට රුපියල් ලක්ෂය (රු.100,000/-)ක මුදලක් ලබාදී ඉතිරි රු. 6,520/- ක මුදල දින දෙකක් තුළ ලබාදෙන බවට පවසා දොපර්ශවය ඒ ආකාරයන් පැමිණිල්ල විසදා ගත් බවත්, පැමිණිල්ල ඉල්ලා අස් කර ගැනීම ගැනීම සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන්ගේ කිසිදු මැදිහත්වීමක් සිදුනොවූ බවත්, දොපාර්ශවයේ එකගතාවය මතම පමණක් පැමිණිල්ල ඉල්ලා අස් කර ගැනීම සිදු වූ බවත්, ඒ අනුව 2022.09.11 දින පැය 13.45 ට සැකකරු වූ එම්.ජී.ටී.ඩී. මැදවත්ත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය) යන අය මුදා හැරීම සිදු කරන ලද බවත් අලුත්ගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ 2022.11.20 දිනැති වාර්තාවේ සඳහන් කර ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එම්.ජී.ටී.ඩී. මැදවත්ත (පැමිණිලිකාර පාර්ශවය) යන අය විසින් සිදු කර ඇති පැමිණිල්ල අනුව ඔහු හට ආහාර පාන නොදී වෙනත් චෝදනාවන්ට ලක්වූ සැකකරුවන් සමඟ සිර මැදිරියේ රඳවා තැබූ බවට සඳහන් කර ඇති අතර, අත්අඩංගුවට ගත් අය පොලිස් පරික්ෂකවරයෙකුගේ පුතෙක් වීම නිසා හෝ වෙනත් හේතුවක් මත හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව අනුව ඔහුට විශේෂත්වයක් දැක්විය නොහැකි බැවින්, ඔහුව ද සිර මැදිරියේ රඳවා තැබූ බව ඉහත කී වාර්තාව තුළින් වැඩිදුරටත් දක්වා ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2023.03.01 වන දින කොමිෂන් සභාව හමුවේ පරික්ෂණයක් සඳහා කැඳවා තිබූ අතර, වගඋත්තරකරු පැමිණ සිටි නමුත්, පැමිණිලිකරු පරික්ෂණය සඳහා සහභාගි වී නැත.

නැවත මෙම පරික්ෂණය 2023.03.23 දින පැවැත්වූ අතර, එදින අදාළ වගඋත්තරකරු සහ පැමිණිලිකරු පරික්ෂණයට සහභාගි වී ඇත. එහිදී වගඋත්තරකාර පො.ප. අලෝක මහතා විසින් මෙම අත්අඩංගුවට ගැනීමට අදාළව සිදුකරන ලද පරික්ෂණය සම්බන්ධයෙන් වැඩිදුර කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අසන ලද ප්‍රශ්ණ වලට පහත පරිදි පිළිතුරු ලබාදී ඇත.

කාඩ්පතක් නැති වූ බවට කරන ලද පැමිණිල්ල සටහන් කිරීමේදී එම කාඩ්පත් හිමිකාරිය එම කාඩ්පත තබා තිබූ ස්ථානය පිළිබඳව කරුණු විමසීමක් කළේද යන්න විමසා ඇති අතර, ඊට පිළිතුරු වශයෙන්

ඔව් යන්න පවසා ගෙදර මැද සාලයේ තිබෙන මේසයේ ඇති පොත් අස්සේ මුදල් පසුම්බිය දමා තිබු බවත්, එහි ATM කාඩ්පත තිබු බවත් සඳහන් කර ඇති බව දක්වා සිටි.

අදාළ ATM කාඩ්පතේ රහස්‍ය අංකය විත්තිකරු කෙසේ දැනගත්තේ ද යන්න පැමිණිලිකාරියගෙන් විමසා සිටියේද යන්න සඳහා පිළිතුරු වශයෙන් ප්‍රකාශ කර සිටියේ හදිසියේ අසනීප වූ නිසා තිළිණ (එම්.ජී.ටී.ඩී. මැදවත්ත යන පැමිණිලිකාර පාර්ශවය)ට කෝල් කරලා බයික් එකෙන් බේරුවල ATM යන්ත්‍රයට ගොස් මුදල් ලබාගැනීමේදී ඒ බව තිළිණ යන අය බලා සිටි බවත්, කිහිප අවස්ථාවකදී තිළිණ සමඟ ATM යන්ත්‍රයෙන් මුදල් ලබාගෙන ඇති බවත් ඇය විසින් ප්‍රකාශ කළ බවයි.

පොලිසියට ලද පැමිණිල්ල අනුව වාර 28 කදී පමණ මුදල් ලබාගෙන ඇති බවට දක්වා ඇති නිසා එවැනි වාර ගණනක් සැකකරු ATM කාඩ්පත මුදල් පසුම්බියෙන් ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් විමසීමක් කළේද යන්න සම්බන්ධයෙන් වගඋත්තරකරු පිළිතරු ලබාදෙමින් සඳහන් කර සිටියේ ඒ සම්බන්ධයෙන් කිසිවක් දක්වා නොමැති බවයි.

වැඩිදුරටත් වගඋත්තරකරුගෙන් විමසන ලද්දේ ATM කාඩ්පතෙන් අවසන් වරට මුදල් ලබාගෙන ඇත්තේ කවදාද යන්නයි. ඒ සම්බන්ධයෙන් ද කිසිදු විමසීමක් කර නැති බවට වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරු වැඩිදුරටත් 2023.09.05 දින කොමිෂන් සභාව වෙත ලිඛිතව කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් මීට පෙර තොරතුරු සටහන් පොත් හා සියලු ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර එය විමර්ශනය කළ බවත්, වැඩිදුරටත් තමාගේ නිර්දෝෂීභාවය සනාථ කිරීම සඳහා HC E BA 1335/23 නඩුවට අදාළව කොළඹ මහාධිකරණ විනිසුරු ඒ.කේ.එම්.පටබැඳිගේ ගරු විනිසුරුතුමා විසින් 2023.07.05 දිනැති ඇප නියෝගයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික කරන ලද පිටපතක් කොමිෂන් සභාවේ අවධානය සඳහා යොමු කරන බවත්, එම නියෝගයේ පිටු අංක 10 සිට 12 දක්වා ඇති ඡේදයන් හි දැක්වෙන පරිදි පැමිණිල්ලක් කළ පමණින් ඒ මත පිහිටා පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම විමර්ශන නිලධාරියෙකුගේ කාර්ය භාරය නොවන බවත්, විශේෂයෙන්ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ 116 වගන්තිය යටතේ විමර්ශනයක් කරන නිලධාරියෙක්ට ඉදිරිපත් කරන තොරතුරු පිළිගත හැකි කරුණු මත පදනම් වී තිබේනම් හා ඔහු සංඥය වරදක් කර තිබේ නම්, වරෙන්තුවක් රහිතව ඔහු අත්අඩංගුවට ගත හැකි බවයි. ඒ අනුව මෙම පැමිණිලිකරුට විරුද්ධව අලුත්ගම පොලිස් ස්ථානයේ පො.කො. 95111 සිසිර යන නිලධාරියා ද, අංක 72, හාතතුඩුව, කලවිල. බේරුවල පදිංචි වික්‍රමාරච්චිගේ කරුණාසේන යන අය විසින් ද පිළිගත හැකි කරුණු සහිත සාක්ෂි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති බැවින් සහ පැමිණිලිකාරියගේ පැමිණිල්ල මත දණ්ඩ නීති සංග්‍රහයේ 386 සහ 389 වගන්ති යටතේ සංඥය වරදක් කර ඇති බැවින්, සැකකරුට චෝදනාව කියාදී අත්අඩංගුවට ගත් බව සඳහන් කරයි.

## නිරීක්ෂණ

පැමිණිලිකරුට විරුද්ධව 2022.09.09 දින ATM කාඩ්පතකින් මුදල් ලබාගැනීම යටතේ පැමිණිල්ලක් අලුත්ගම පොලිස් ස්ථානය වෙත ලැබී ඇති බවත්, එම පැමිණිල්ලේ පැමිණිලිකාරිය සහ කොමිෂන් සභාවේ මෙම පැමිණිලිකරු වන එම්.ජී.ටී.ඩී. මැදවත්ත යන අය හිතවත් පුද්ගලයන් බවත් නිරීක්ෂණය වේ.

එසේම, එකී පොලිස් පැමිණිල්ලට අනුව එම පැමිණිලිකාරිගේ ATM කාඩ්පතෙන් 2022.06.07 දින සිට 2022.08.27 වන දින දක්වා වාර 28 කට වැඩි ප්‍රමාණයකදී මුදල් ඉවත් කර ගෙන ඇති බවට නිරීක්ෂණය වේ.

මෙම කාලය මාස දෙකක් වන අතර, එම කාලය තුළ එම ATM කාඩ්පත අස්ථානගතවීම හෝ වෙනත් කිසිවෙක් විසින් සොරා ගැනීම සිදුවූයේ නම්, එම කාලය තුළ මෙම ATM කාඩ් පත පැමිණිලිකාරිය සතුව නොමැති බවට දැන නොගැනීම පැමිණිල්ලේ විශ්වාසවන්තභාවය සහ සත්‍ය පැමිණිල්ලක් ද යන්න පිළිබඳ සැකයක් මතු කරයි.

වගඋත්තරකාර පාර්ශවය විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 116 වගන්තිය යටතේ විමර්ශනයක් සිදුකළ බවත්, එම විමර්ශනයේදී ප්‍රමාණවත් කරුණු තහවුරු වූ බවත් ප්‍රකාශ කර ඇත. එහෙත්, වගඋත්තරකරුගේ කරුණු ඉදිරිපත් කිරීම තුළ එවැනි විධිමත් පරීක්ෂණයක් සිදුකළ බවට නිරීක්ෂණය නොවන අතර, පැමිණිල්ල සටහන් කර ගැනීමේදී එම ATM කාඩ්පත නැති වූ දිනය පැමිණිලිකාරිය විසින් සඳහන් කර නැති බවත්, එම කාඩ්පතේ රහස්‍ය අංකය සැකකාර පුද්ගලයාට ලැබුණු ආකාරය නිශ්චිත නොමැති බවත්, එම පැමිණිලිකාරිය ATM යන්ත්‍රය මඟින් අවසන් වරට මුදල් ලබාගත් දිනයක් ද දක්වා නොමැති බවත් නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කරන ආකාරයට සැකකරු එනම්, එම්.ජී.ටී.ඩී. මැදවත්ත යන පැමිණිලිකාර පාර්ශවය විසින් වාර 28 කට වැඩි කාලයක් ATM කාඩ්පතෙන් මුදල් ලබාගෙන ඇති අතර, ඒ අනුව එම කාලය තුළ ම ATM කාඩ්පත සැකකරු සන්තකයේ තිබුනේ ද, එසේ නොමැතිව වරින් වර 28 වාරයකට වැඩි ප්‍රමාණයක් සැකකරු විසින් පැමිණිලිකාරියගේ මුදල් පසුම්බියෙන් එම කාඩ්පත ලබා ගත්තේ ද, එසේ ලබාගැනීමට හැකියාවක් තිබුනේ ද යන්න පිළිබඳව සැලකීමේදී බැලුබැල්මට මෙම පැමිණිල්ලේ විශ්වාසවන්ත භාවය සම්බන්ධයෙන් සැකයක් මතු වේ. එම සැකය තහවුරු කර ගැනීම විමර්ශන නිලධාරියෙක් විසින් සිදුකළ යුතු අතර, එය අදාළ විමර්ශන නිලධාරියා විසින් සිදුකර නැත. ඒ අනුව සැකකරුට විරුද්ධව ලැබී ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදුකර නොමැති බවට නිරීක්ෂණය වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය වන එම්.ජී.ටී.ඩී. මැදවත්ත යන අයට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 386 සහ 389 යන වරදවල් සම්බන්ධයෙන් චෝදනා ගොනු කර ඇති අතර, එම වරදවල් යටතේ වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකාර පාර්ශවය කොළඹ උසස් අධ්‍යාපන තාක්ෂණික විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිසුවෙකු බවත්, එම කාලය තුළ ඔහුගේ විභාග පවත්වා ඇති බවත් උසස් අධ්‍යාපන ආයතනයෙන් ලබාදී ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය වන එම්.ජී.ටී.ඩී. මැදවත්ත සහ ඔහුගේ පියා මීට අදාළ මුදල් ගෙවා සමථයකට පත්වීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර, ඒ අනුව පැමිණිල්ල ඉල්ලා අස් කර ගෙන ඇත. ඒ සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය විසින් ප්‍රකාශ කර සිටින්නේ, එම කාල වකවානුවේ අවසන් වසරේ විභාගයට පෙනීසිටීමට තිබූ බැවින්, යම් ආකාරයකින් බන්ධනාගාර ගතවීමට සිදුවුවහොත් අදාළ විභාගය සඳහා පෙනීසිටීමට අවස්ථාව නොලැබෙන බවත්, එසේ වුවහොත් එය තමාගේ ජීවිතයට සිදුවන බරපතල හානියක් බැවින්, එය වළක්වා ගැනීම සඳහා එම අවස්ථාවේදී තිබූ තත්ත්වය මත එවැනි සමථයකට පත් වීමට සිදුවූ බවයි.

වගඋත්තරකරු විසින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් බවට පිළිගෙන ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවයේ විමර්ශන වාර්තා වලට අනුව සැකකරු සීසී ටීවී කැමරා වල එක් අවස්ථාවකදී සිටින බවට නිරීක්ෂණය වී ඇති සඳහන් වේ. ඒ සඳහා ඔවුන් යොදාගෙන ඇත්තේ සැකකරුගේ ඡායාරූපයක් වන අතර, එම ඡායාරූපය අනුව 2022.08.27 වන දින සීසී ටීවී දර්ශන වල සිටින්නේ සැකකරු බවට හඳුනා ගෙන ඇත. එහෙත් එම හඳුනාගැනීම විමර්ශන නිලධාරියා නිසි අයුරින් තහවුරු කර ගැනීමක් සිදුකර නැති බවට නිරීක්ෂණය වේ. එසේම, 2022.08.21 දින සිට 2022.08.27 වන දින දක්වා සීසී ටීවී දර්ශන පරීක්ෂා කළ බව වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර තිබුණ ද, අදාළ කාඩ්පතෙන් මුදල් ලබාගෙන ඇති බවට පැමිණිලි කර ඇති 2022.08.21 වන දින සීසී ටීවී දර්ශන තුළින් සැකකරු මුදල් ලබාගත් බවට හඳුනාගෙන නොමැති බව ද නිරීක්ෂණය වේ.

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ද මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඇති අතර, ඒ අනුව කළුතර කොට්ඨාශයේ අපරාධ විමර්ශන අංශය මගින් කරන ලද වැඩිදුර විමර්ශනයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකාර පාර්ශවය වන එම්.ජී.ටී.ඩී. මැදවත්ත යන අය මෙම වරද සිදුකර නොමැති බවටත්, අදාළ ATM කාඩ්පත භාවිත කර මුදල් ලබාගැනීම සිදු කර ඇත්තේ ATM කාඩ්පතෙහි හිමිකාරිය වන ඉහත කී වික්‍රමාරච්චිගේ සිතාරා හර්ෂනි යන අයගේ නංගී විසින් බවට අනාවරණය වී ඇති බවත් ජාතික පොලිස් කොමිෂන්

සභාව විසින් යොමු කර ඇති අංක NPC/PCID/WP/KL/35/23 සහ 2024.10.24 දිනැති ලිපියට අමුණා ඇති අංක SVIII/54/P/2023 සහ 2023.05.25 දිනැති කළුතර කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ වාර්තාව අනුව නිරීක්ෂණය වේ. එසේම, වගඋත්තරකරු වන පො.ප. ආලෝක මහතාට විරුද්ධව විනය පියවර ගන්නා ලෙසට සහකාර පොලිස් අධිකාරීවරයා වෙත නියෝග කර ඇති බව ද නිරීක්ෂණය වේ.

## නිගමනය

මෙම පැමිණිල්ල අනුව කොමිෂන් සභාව විසඳිය යුතු ගැටළුව වනුයේ මෙම අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කර ඇති ආකාරයට සිදුකර තිබේද නැත්ද යන්නයි. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 වගන්තිය අනුව සංඥය වරදක් කර ඇති අවස්ථාවකදී වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමක් සිදුකළ හැකි නමුත්, වරෙන්තුවක් නොමැතිව යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගන්නේ නම්, නිසි පැමිණිල්ලක්, නිසි තොරතුරක් සහ සාධාරණ සැකයක් තිබිය යුතු අතර, එය විමර්ශන නිලධාරියා විසින් විමර්ශනයකට ලක් කොට තහවුරු කර ගැනීමෙන් පසුව අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකළ යුතු ය.

මෙම පැමිණිලිකරුට විරුද්ධව අලුත්ගම පොලිසියට සිදුකරන ලද පැමිණිල්ල පිළිබඳව විමර්ශන නිලධාරියා විසින් නිසි විමර්ශනයක් සිදුකලේ නම්, එම පැමිණිල්ලේ සත්‍ය අසත්‍යතාවය සහ නිවැරදිතාවය පිළිබඳව සැකයට තුඩු දෙන ඉහත නිරීක්ෂණය වූ කරුණු විමර්ශන නිලධාරියා විසින් සොයා ගැනීම කළ යුතු අතර, එසේ නොකොට හුදු සැකය මත පමණක් අත්අඩංගුවට ගැනීම නොකළ යුතු ය.

<u>ලන්දගේ ඉෂාරා අංජලී සහ විජේසිංහ චූලංගනී</u> එදිරිව <u>වරුණ බෝගහවත්ත සහ වෙනත් අය</u> (SCFR 677/2012) නඩුවේදී, "1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව අනුව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් නිදහස් වන අතර, යම් හෙයකින් නිදහස අහිමි කරන්නේ නම් නීතියෙන් ස්ථාපිත කර ඇති ක්‍රියාපටිපාටිය දැඩි ලෙස අනුගමනය කළ යුතු බවට නියෝග කරයි. මෙම ක්‍රියාපටිපාටියේ විධිවිධාන සකසා ඇත්තේ අභිමතය පරිදි හෝ අත්නෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම වැළැක්වීට සහ පුද්ගල වාසි සහ දේශපාලන අරමුණු සඳහා අධිකරණ බලය අයුතු ලෙස භාවිත කිරීම වැළැක්වීමට" බව දක්වා ඇත.

එසේම, <u>කපුගීකියනගේ</u> එදිරිව <u>හෙට්ටිආරච්චි සහ වෙනත් අය</u> (1984) 2 Sri L.R. 153 නඩුවේදී " අත්අඩංගුවට ගැනීමේදී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි සඳහන් නීතිය මගින් ස්ථාපිත කරන ලද ක්‍රියාපටිපාටිය හැර වෙනත් ක්‍රියාපටිපාටියක් යොදාගත නොහැක" යනුවෙන් දක්වා ඇත.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි 116 වන වගන්තිය යටතේ විමර්ශනය කරන නිලධාරියෙකුට ඉදිරිපත් කරන තොරතුරු පිළිගත හැකි කරුණු මත පදනම් වී තිබේ නම් හා ඔහු සංඥය වරදක් කර තිබේ නම්, වරෙන්තුවක් රහිතව අත්අඩංගුවට ගත හැකි නමුත්, ඉහත කරුණු අනුව විමර්ශන නිලධාරියාට ඉදිරිපත් වී ඇති කරුණු නිසි විමර්ශනයකට ලක් කර නැති බවටත්, විමර්ශන නිලධාරියාට ලද තොරතුරු පිළිගත හැකි තොරතුරු ද යන්න තහවුරු කර නොමැති බවටත් තහවුරු වේ. ඒ අනුව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි 32 වගන්තිය ප්‍රකාරව අත්අඩංගුවට ගැනීමට පෙර අදාළ පැමිණිල්ල නිසි විමර්ශනයක් නොකර අත්අඩංගුවට ගැනීමක් සිදුකර ඇති බව තහවුරු වේ.

එසේහෙයින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ දී නීතියෙන් නියම කරන ලද කාර්ය පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව අත්අඩංගුවටගෙන ඇති බව තහවුරු වන බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව තුළින් සුරක්ෂිත කොට ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එමෙන්ම, මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ දී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ප්‍රතිපාදන අදාළ කර නොගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවද මෙයින් නිගමනය කරනු ලැබේ.

<u>නිර්දේශ :</u>

1. වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත රු.25,000/- ක මුදලක් වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

2. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇති ආකාරයට අදාළ වගඋත්තරකරුට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන ඇත්ද යන්න පොලිස්පතිවරයා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.

2024. 12 . 27 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට

දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.